**කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර.**

**දෙවන වාර ඇගයීම - 2018**

**පුරවැසි අධ්‍යාපනය I - II**

**6 ශ්‍රේණිය**

**කාලය පැය 02**

**සැලකිය යුතුයි.**

**(i) I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය බැවින් එම ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

I කොටස

- ප්‍රශ්නවලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පාසලෙන් ඉටුවන ප්‍රධාන කාර්යය වනුයේ,
   1. විභාග සමත් වීමට අවශය දැනුම ලබා දීමයි.
   2. රැකියාවක් සඳහා පුහුණු කිරීමයි.
   3. නැණ ගුණ දහමින් යුත් පුරවැසියන් බිහි කිරීමයි.
   4. නායකයින් තැනීමයි.

2. පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් කෙරෙනුයේ,
   1. පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාසනය වූ ආකාරය පිළිබඳ තොරතුරුය.
   2. පාසල ආරම්භ වූ දිනයයි.
   3. පාසලෙන් බිහිවූ උගත් පුද්ගලයන්ය.
   4. පාසලේ වර්තමාන තත්වයයි.

3. පාසල් සංවිධාන ව්‍යුහයේ ඉහළින්ම සඳහන් වන්නේ,
   1. ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2. ආදි ශිෂ්‍යයන් 3. විදුහල්පති 4. ගුරු භවතුන්

4. පහත දක්වෙන කාර්යයන් අතරින් පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළ වන්නේ,
   1. දෙමාපියන්, ආදිශිෂ්‍යයන්, බාහිර ප්‍රජාව හා ආයතන සමග සමීපව කටයුතු කරමින් පාසල දියුණුව කරා ගෙන යාම.
   2. ශිෂ්‍ය ශිෂ්‍යාවන් විනයවත් කිරීම හා හික්මවීම.
   3. හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම.
   4. පාසලේ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීමට සහාය වීම.

5. නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුද නාමයෙන් හඳුන්වන ලද්දේ,
   1. එස්. ඩබ්. ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා
   2. ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමා
   3. ලලිත් ඇතුළත් මුදලි මැතිතුමා
   4. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා

6. පාසල අනාගතයේදී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ හඳුන්වනුයේ කුමන නමකින්ද?
   1. මෙහෙවර 2. දැක්ම 3. පරමාර්ථය 4. ඉලක්කය

7. පාසලෙන් සමාජයට ඉටුකරන සේවාවක් වනුයේ,
   1. පාසල සතු දේපල ආරක්ෂා කිරීම.
   2. අනාගත නායකයන් පුහුණු කිරීම.
   3. පාසලේ සංවර්ධනයට සහාය වීම.
   4. පාසලේ පැවැත්වෙන විවිධ උත්සවයන්ට සහභාගී වීම.

8. අපේ රටේ පරිපාලන බෙදීම අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,
   1. ප්‍රදේශිය ලේකම් කොට්ඨාසය  2. දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය
   3. ග්‍රාම නිලධාරි කොට්ඨාසය  4. මහ නගර සභාව

9. ශ්‍රී ලංකාව බෙදා ඇති පරිපාලන දිස්ත්‍රික්ක ගණන,
   1. 25 කි.  2. 26 කි  3. 28 කි.  4. 30 කි.

10. ශ්‍රී ලංකාවේ පළාත් බෙදා ඇති ආකාරය අනුව පළාත් සංඛ්‍යාව වනුයේ
   1. 9 කි.  2. 10 කි.  3. 12 කි.  4. 8 කි.

11. ස්වාභාවික නොවන සම්පතක් වන්නේ පහත දැක්වෙන දෑ වලින් කවරක්ද?
   1. ජලය  2. වනාන්තර  3. හිරුඑළිය  4. ගොඩනැගිලි

12. ◆ හැඳුනුම්පතක් සකස්කර ගැනීම
   ◆ ග්‍රාම සේවා සහතිකයට අනුමැතිය ලබා ගැනීම.
   ඉහත කාර්යන් වෙනුවෙන් සේවා සලසන ආයතනය වනුයේ
   1. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය  2. නගර සභාව
   3. පොලීසිය  4. තැපැල් කාර්යාලය

13. මහනගර සභාව මගින් ඉටුවන සේවාවකි.
   1. මාර්ග පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම.
   2. ග්‍රාමීය මාර්ග අළුත්වැඩියා කිරීම.
   3. ග්‍රාමීය සෞඛ්‍ය සායන පැවැත්වීම.
   4. පුස්තකාල හා ළදරු පාසල් පවත්වා ගෙන යෑම.

14. පොදු ජනතාවට සේවා සපයන ආයතනවල යුතුකමක් වනුයේ,
   1. සේවාවෙන් ලාභ ලැබීම.  2. පක්ෂපාතීව කටයුතු කිරීම.
   3. තම සේවාව නිසි අයුරින් ලබා දීමට කටයුතු කිරීම.  4. මහජන පැමිණිලි නොසලකා හැරීම.

15. ගමේ පොදු සුභ සාධක කටයුතු නංවා ලීම වෙනුවෙන් පිහිටුවා ගන්නා සමිතියකට උදාහරණයක් වන්නේ,
   1. ග්‍රාම සංවර්ධන සමිතිය  2. අවමංගල්‍යාධාර සමිතිය
   3. ක්‍රීඩා සමිතිය  4. ණය දෙන සමිති

16. සහන මිලකට සාධාරණ අයුරින් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා ජනතාව එක් වී පිහිටුවා ගනු ලබන සමිතියක් වන්නේ,
   1. සමූපකාර සමිතිය  2. පරිසර සමිතිය  3. යෞවන සමිතිය  4. ගොවි සමිතිය.

A. ගායන හැකියාව  C. යෞවන සමිතිය
B. ඉදිරියට එමේ මැලිකම (පසුබට බව)  D. ආර්ථික අපහසුතා

17. ඉහත A අක්ෂරයෙන් දැක්වෙන්නේ ඔබ සතු
   1. ශක්තියකි.  2. දුර්වලතාවයකි.  3. අවස්ථවකි.  4. බාධාවකි.

18. ඉහත B අක්ෂරයේ දැක්වෙන්නේ පුද්ගලයෙකු සතු
   1. දුර්වලතාවයකි.  2. හැකියාවකි.  3. ශක්තියකි.  4. වටිනාකමකි.

19. ඉහත D අක්ෂරයේ දැක්වෙන්නේ,
   1. අවස්ථාවකි.  2. බාධාවකි.  3. දුර්වලතාවයකි.  4. අභියෝගයකි.

20. "ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත" යන කියමන තුළින් ප්‍රකාශ වනුයේ,
   1. පුද්ගල හැකියාව ඒකාකාරී වන බවයි.
   2. පුද්ගල හැකියා එකිනෙකට වෙනස් වන බවයි.
   3. ලොව සියල්ලන් සමාන දක්ෂතා උරුම කර ගෙන ඇති බවයි.
   4. එක් අයෙකු සමත් වන්නේ එක් දෙයකට පමණක් බවයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1. i. පාසලෙන් සමාජයට ඉටුවන කාර්යයන් 2 ක් ලියන්න.
   ii. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැන ගැනීමට උපකාරී වන මූලාශ්‍ර 2 ක් සඳහන් කරන්න.
   iii. පාසලේ අනන්‍යතාවය පිළිඹිබු කරන සංකේත 02 ක් නම් කරන්න.
   iv. පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් විවිධ භූමිකා අතුරෙන් 2 ක් නම් කරන්න.
   v. ඔබේ හැකියා වර්ධනය කර ගැනීමට රජය විසින් සපයා ඇති පහසුකම් 2 ක් දක්වන්න.
   vi. ගුරු මණ්ඩලය වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 2 ක් ලියන්න.
   vii. අප අවට පරිසරයේ ඇති භෞතික සම්පත්වලින් ලබා ගන්නා ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න
   viii. සමාජයේ ජීවත් වීමේදී විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අපට සහාය වන පුද්ගලයින් දෙදෙනෙකු හා ඉටුවන සේවා 2 ක් සඳහන් කරන්න.
   xi. ඔබ ප්‍රදේශයේ පිහිටා ඇති ආගමික සිද්ධස්ථාන මගින් සිදුවන සේවාවන් 2 ක් සඳහන් කරන්න.
   x. ඔබ ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ගත් සමිති/සමාගම් 2 ක් නම් කරන්න.

(ලකුණු 2x10= 20)

02. i. පුද්ගලයෙකු සතු හැකියා වැඩිදියුණු කර ගැනීම සඳහා කළ හැකි කාර්යයන් 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

ii. පුද්ගලයෙකු සතු දුර්වලතා මඟ හරවා ගැනීමට කළ හැකි කාර්යයන් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. (a.) අධ්‍යාපන කටයුතුවල නිරත වන ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(b) එම අභියෝග ජය ගැනීමට කළ හැකි කාර්යයන් 03 ක් පෙන්වා දෙන්න. (ලකුණු 03)

03. i. සැලැසුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

ii. සැලසුමකට අනුව කටයුතු සිදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් දක්වන්න (ලකුණු 03)

iii. දවස ගත කරන අයුරු දැක්වෙන ඔබේ කාල සටහනේ සඳහන් විය යුතු කරුණු 5 ක් ලියා දක්වන්න. (ලකුණු 05)

04. i. පාසල් සංස්කෘතියට අයත් අංග 02 ක් නම් කරන්න.
(ලකුණු 02)

ii. ඔබේ පාසලේ පවත්නා නීති රීති තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. පාසලේ සාමාජිකයෙකු ලෙස ඔබට හිමි වන අයිතිවාසිකම් 03 ක් දක්වා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. i. පාසල් සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ඔබට හිමි අයිතිවාසිකම් 2 ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

ii. පාසල් අධ්‍යාපනය ලබන ඔබට හිමි වන අයිතිවාසිකම් ලබා ගැනීමට ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියා දක්වන්න.

(ලකුණු 03)

iii. සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඔබට ඉටු කළ හැකි යුතුකම් 03 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. ඔබ ජීවත්වන පරිපාලන දිස්ත්‍රික්කයට යාබදව පිහිටා ඇති දිස්ත්‍රික්ක 02 ක් නම් කරන්න.

(ලකුණු 02)

ii. ඔබ ජීවත් වන පළාතට අයත්වන දිස්ත්‍රික්ක ලියා දක්වන්න. (ලකුණු 03)

iii. කළුතර දිස්ත්‍රික්කය ඇසුරෙන්,

(අ) වගා කරන ප්‍රධාන බෝග වර්ග 02 ක් නම් කරන්න.

(ආ) පිහිටා ඇති පූජනීය සිද්ධස්ථාන 02 ක් නම් කරන්න.

(ඇ) ඓතිහාසිකව වැදගත්වන ස්ථානයක් නම් කරන්න. (ලකුණු 05)

07. i. භෞතික සම්පත් බෙදා දැක්වෙන ආකාර 02 කුමක්ද? (ලකුණු 02)

ii. භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් දක්වන්න. (ලකුණු 03)

iii. මානව සම්පත් යනු කුමක්දැයි හඳුන්වා උදාහරණ 05 ක් දක්වන්න. (ලකුණු 05)

08. i. සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. ඔබ ප්‍රදේශයේ ජීවත්වන ජනතාව වෙනුවෙන් විවිධ සේවාවන් සලසන නිලධාරීන් තිදෙනකු නම් කරන්න.

(ලකුණු 03)

iii. ඔබට සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන 03 ක් දක්වා එක් ආයතනයක් මගින් සලසන සේවාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)